10 ශ්‍රේණිය

හත්වන ඒකකය
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
Information & Communication Technology

I කොටස

අංක 1 සහ 2 ප්‍රශ්න සඳහා පහත දී ඇති පැතුරුම්පත් ඛණ්ඩය පාදක වී ඇත.

	A	B	C
1	1	2	3
2	4	5	6
3	5		
4			

1. C3 කෝෂයෙහි = count (A1:B3) සූත්‍රය ඇතුළත් කර ඇති විට පහත කුමක් C3 කෝෂයෙහි දැක්වේ ද? (2016)
   1) 1 2) 3 3) 5 4) 6

2. A3 කෝෂයෙහි = sum ($A1:A2) සූත්‍රය දී ඇත. මෙම සූත්‍රය B3 කෝෂයට පිටපත් කළ විට B3 කෝෂයෙහි පහත කුමක් දැක්වේ ද? (2016)
   1) 5 2) 7 3) 11 4) 12

3. දකුණත් භාවිතකරුවකු විසින් ගොනු බහාලුමක් (Folder) තුළ තිබෙන පැතුරුම්පත් ගොනුවකට සිදු කරන ලද පහත සඳහන් කාර්යය සලකා බලන්න. (2017)
   A - මූසික දර්ශකය (Mouse Pointer) ගොනුව මත ස්ථානගත කර මූසිකයේ දකුණු බොත්තම එක් වරක් ක්ලික් කිරීම.
   B - මූසික දර්ශකය ගොනුව මත ස්ථානගත කර මූසිකයේ දකුණු බොත්තම දෙවරක් ක්ලික් කිරීම.
   C - මූසික දර්ශකය ගොනුව මත ස්ථානගත කර මූසිකයේ වම් බොත්තම දෙවරක් ක්ලික් කිරීම.

   ඉහත සඳහන් ඒවායින් පැතුරුම්පත් ගොනුව විවෘත වීම සිදු වනුයේ
   1) A මගින් පමණි 3) C මගින් පමණි
   2) B මගින් පමණි 4) A හා C මගින් පමණි

4. පැතුරුම්පතක කෝෂයකට = 2^3+(5-3)*6/4 සූත්‍රය ඇතුළත් කර තිබේ. එම කෝෂයෙහි පෙන්නුම් කරනු ලබන සංඛ්‍යාව කුමක් ද? (2017)
   1) 5 2) 8.5 3) 11 4) -1.25

අංක 5 සහ 6 ප්‍රශ්න සඳහා දී ඇති පැතුරුම්පත් කොටස සහ පහත දක්වා ඇති තොරතුරු පාදක කරන්න.

	A	B	C
1	අරය	පරිධිය	π
2	20	125.6637061	3.14159
3	21	131.9468915	
4	25	157.0796327	
5	22	138.2300768	

- ➢ අරය r ලෙස දී ඇති විට වෘත්තයක පරිධිය ගණනය කිරීම සඳහා $2\pi r$ සූත්‍රය භාවිත කරනු ලැබේ.
- ➢ C2 කෝෂයේ දක්වා ඇත්තේ π හි අගය බව උපකල්පනය කරන්න.

5. වෘත්තයේ පරිධිය ගණනය කිරීම සඳහා B2 කෝෂයට ඇතුළත් කළ යුතු සූත්‍රය කුමක් ද? (2017)
   1) = 2*$C$2*A2 3) = 2*C2^A2
   2) = 2*$C2^$A2 4) = 2^C2^A2

6. A6 කෝෂයට = SUM (A2:A5) / COUNT (A2:A5) සූත්‍රය ඇතුළත් කළ විට පහත සඳහන් කවරක් A6 කෝෂයේ දිස්වන්නේ ද? (2017)
   1) 1 2) 17.6 3) 22 4) 88

අංක 7 සහ 8 ප්‍රශ්න සඳහා දී ඇති පැතුරුම්පත් කොටස පාදක වේ.
$y = px^2 + qx + r$ යන සමීකරණය භාවිත කර දී ඇති x හි අගයයන්ට අනුරූප y හි අගයයන් ගණනය කළ යුතුව ඇත. p, q සහ r නියතවල අගයයන් පිළිවෙළින් B1, B2 සහ B3 කෝෂවල ද, x හි අගය පරාසය C2:C6 කෝෂවල දක්වා ඇත.

	A	B	C	D
1	p	2	x	y
2	q	3	-2	
3	r	5	-1	
4			0	
5			1	
6			2	

7. X = -2 වන විට, y හි අගය ලබාගැනීමට D2 කෝෂයේ ලිවිය යුතු සූත්‍රය කුමක් ද? (2018)
   1) = $B$1*C2*C2+$B$2*C2+$B$3
   2) = B1+C2*C2+B2*C2+$B$3
   3) = (B1*C2)^2+$B$2*C2+$B$3
   4) = $B$1*$C$2*$C$2+$B$2+C2+$B$3

ICT Tutorials HUB

8. Y හි අනෙකුත් අගයන් ලබා ගැනීම සඳහා D2 හි ඇති සූත්‍රය D3:D6 කෝෂ පරාසයට පිටපත් කළේ යැයි උපකල්පනය කරන්න. Y විශාලතම අගය ලබාගැනීම සඳහා D7 කෝෂයේ ලිවිය යුතු සූත්‍රය කුමක් ද? (2018)

1) = AVERAGE (D2:D6)
2) = COUNT (D2:D6)
3) = MAX (D2:D6)
4) = MIN (D2:D6)

9. පැතුරුම්පතක කෝෂයකට = (6-2)^2+(5+4)/3 සූත්‍රය ඇතුළුකළ විට කුමක් දිස්වේ ද? (2018)

1) 5
2) 8.33
3) 19
4) 22.3

10. පැතුරුම්පතක, කෝෂ පරාසයක් (A3:C4) ලෙස දී ඇති අවස්ථාවක් සලකා බලන්න. මෙම පරාසය තුළ අඩංගු කෝෂ මොනවා ද? (2019)

1) A3 හා C4 පමණි.
2) A3, B3 හා C3 පමණි.
3) A3, A4, C3 හා C4 පමණි.
4) A3, B3, C3, A4, B4 හා C4 පමණි.

C2 කෝෂය සඳහා =B2 * B$5 සූත්‍රය ඇතුළත් කර ඇති පහත පෙන්වා ඇති පැතුරුම්පත් කොටස සලකා බලන්න.

	A	B	C
1	Name	Sales (Rs)	Commission (Rs)
2	A. Dias	50000	5000
3	B. Sivarajah	60000	
4			
5	Precentage:	0.1	

11. C2 කෝෂයේ ඇති සූත්‍රය C3 කෝෂයට කොපි කළ විට C3 කෝෂයේ දිස්වන්නේ කුමක් ද? (2019)

1) 0
2) 5000
3) 6000
4) 60000

12. දී ඇති පැතුරුම්පත් කොටසෙහි A1 හා B1 කෝෂවල පිළිවෙළින් 40 හා 50 අගයන් දැක්වේ. C1 කෝෂයට =A$1+B$1 සූත්‍රය ඇතුළත් කළ පසු C1 හි 90 අගය දිස්වේ. මෙම C1 කෝෂයේ ඇති සූත්‍රය, C2 හා D1 කෝෂ වෙත පිටපත් කළේ නම්, C2 සහ D1 හි පිළිවෙළින් දැක්වෙන අගයයන් කවරේ ද? (2020)

C1 =A$1+B$1

	A	B	C	D
1	40	50	90	
2				

1) 90 සහ 90
2) 90 සහ 140
3) 90 සහ 50
4) 50 සහ 90

13. P, Q, R හා S ලෙස ලේබල් කර ඇති සංරචක හතර සමගින් පහත දී ඇති පැතුරුම්පත් කොටස සලකන්න.



P, Q, R හා S ලේබල නිවැරදි අනුපිළිවෙළට පෙන්වනු ලබන්නේ පහත සඳහන් කවරකින් ද? (2020)

1) සක්‍රීය කෝෂය, පේළි ශීර්ෂක, ශ්‍රිත ඇතුළු කිරීම, තීරු ශීර්ෂක
2) සක්‍රීය කෝෂය, පේළි ශීර්ෂක, තීරු ශීර්ෂක, ශ්‍රිත ඇතුළු කිරීම
3) ශ්‍රිත ඇතුළු කිරීම, තීරු ශීර්ෂක, සක්‍රීය කෝෂය, පේළි ශීර්ෂක
4) සක්‍රීය කෝෂය, තීරු ශීර්ෂක, පේළි ශීර්ෂක, ශ්‍රිත ඇතුළු කිරීම

14. පැතුරුම්පතක C2:E5 ලෙස දී ඇති කෝෂ පරාසයක් සඳහා නිවැරදි වන්නේ පහත සඳහන් කවර ප්‍රකාශය/ප්‍රකාශ ද? (2020)

A - පරාසයේ ඇති පේළි සංඛ්‍යාව තුනකි.
B - මෙම කෝෂ පරාසයේ ජ්‍යාමිතික හැඩය සෘජුකෝණාස්‍රයකි.
C - පරාසයේ ඇති මුළු කෝෂ සංඛ්‍යාව 12 කි.

1) A පමණි
2) C පමණි
3) A හා B පමණි
4) B හා C පමණි

15. P, Q, R සහ S ලෙස ලේබල කරන ලද සංරචක හතරක් සහිත පහත දී ඇති පැතුරුම්පත් කොටස සලකා බලන්න.



පහත සඳහන් කවරක් මගින් P,Q,R සහ S ලේබල නිවැරදි අනුපිළිවෙළට පෙන්වනු ලබන්නේ ද? (2021)

1) තීරු ශීර්ෂක, සූත්‍ර තීරුව, නාම කොටුව, වැඩපටිති (Sheet tabs)
2) නාම කොටුව, තීරු ශීර්ෂක, වැඩපටිති, සූත්‍ර තීරුව
3) නාම කොටුව, සූත්‍ර තීරුව, තීරු ශීර්ෂක, වැඩපටිති
4) වැඩපටිති, සූත්‍ර තීරුව, තීරු ශීර්ෂක, නාම කොටුව

ප්‍රශ්න අංක 16 හා 17 සඳහා පිළිතුරු දීමට, ඉලෙක්ට්‍රොනික පැතුරුම්පතකට ඇතුළත් කර පහත දී ඇති ලකුණු ලැයිස්තුවක කොටස සලකා බලන්න.

A7 =COUNT(A1:D5)

Book1

	A	B	C	D	E
1	Name	ICT	Maths	Relegion	Total
2	Sahan	60	55	70	
3	Oshini	35	absent	60	
4	Raji	75	65	absent	
5	Pooja	55	45	75	

16. සහන් ලබාගත් මුළු ලකුණු ගණනය කිරීමට E2 කෝෂය තුළ ඇතුළත් කළ යුතු නිවැරදි සූත්‍රය කුමක් ද? (2021)

1) =B2+C2+D2
2) B2+C2+D2
3) E2=B2+C2+D2
4) E2->B2+C2+D2

17. =COUNT (A1:D5) සූත්‍රය A7 කෝෂයට ඇතුළත් කළේ නම්, එහි දිස්වන අගය කුමක් ද? (2021)

1) 10
2) 12
3) 16
4) 20

ප්‍රශ්න අංක 18 හා 19 සඳහා පිළිතුරු දීමට සැපයීමට පහත පැතුරුම්පත් කොටස සලකන්න.

	A	B	C	D
1	3	2	4	
2	5	7	6	
3	8	9	1	

18. D1 කෝෂයට =COUNT(A1:C1,B2) සූත්‍රය ඇතුළත් කළ විට එහි කුමක් දිස්වේ ද? (2022)

1) 3
2) 4
3) 7
4) 9

19. D3 කෝෂයට =A1^C3*(C1-B1) සූත්‍රය ඇතුළත් කළ විට එහි කුමක් දිස්වේ ද? (2022)

1) 6
2) 9
3) 10
4) 79

20. පහත ඒවායින් (I, II, III, IV) වලංගු කෝෂ ලිපින මොනවා ද? (2022)

I – K2 II - $K$2 III – K2$ IV – K2

1) I සහ II පමණි
2) I සහ IV පමණි
3) II සහ III පමණි
4) III සහ IV පමණි

ICT HUB